# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,889 - 2014 නොවැම්බර් මස 14 වැනි සිකුරාදා - 2014.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2001 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 දෙසැම්බර් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 නොවැම්බර් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1999- B 80892—2,875 (2014/11)
B1-

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංශෝධනයයි

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.09.05 දිනැති අංක 1,879 දරන *ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වැනි පන්තියේ 11 වැනි ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014, ඡේද අංක 01 හි ඒ ඒ විෂයයන් යටතේ සඳහන් "ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය" යන්න ඉවත් කරනු ලැබේ.

එම *ගැසට් නිවේදනයේ* සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

අනුර දිසානායක,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2014 ඔක්තෝබර් මස 30 වැනි දින,
"ඉසුරුපාය",
පැලවත්ත, බත්තරමුල්ල,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

11-345

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වැනි ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2014

දිවයින පුරා පිහිටි රාජ්‍ය ආයතනවල ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ සිවිල්, යාන්ත්‍රික, දුම්රිය දෙපාර්තමේන්තුවේ විදුලි (බැර හා ලුහු) ඉංජිනේරු කාණ්ඩවලට අයත් තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් ඉංජිනේරු සහකාරවරයෙකු (කලින් කාර්මික සහකාර) හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක් දරන නිලධාරියකු හෝ අනෙකුත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් පත්වීම් බලධාරියා විසින් අනුමත කරනු ලැබූ සුදුසුකම් ලත් කාර්මික නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ආයතන ප්‍රධානීන් මගින්, ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

කවරයේ වම්පස උඩ කෙළවරේ ''ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම (සීමිත) - 2014'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2014.12.15 දින වේ.

*සටහන.*—ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ද ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

1. *සේවයට බඳවාගැනීමේ ක්‍රමය* :

1.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු ලබා දීමේ පටිපාටිය අනුව, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ජ්‍යෙෂ්ඨත්වයට හා කුසලතාවයට ලබා දෙනු ලබන ලකුණු පිළිවෙල පදනම් කරගෙන තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

1.2 සීමිත බඳවා ගැනීම් යටතේ පත්වීමේ ලිපියක් මගින් ශ්‍රී. ලං. ඉ. සේ. III ශ්‍රේණියට නිලධාරීන් බඳවාගනු ලබන අවස්ථාවේ දී ඔවුන්ගේ සේවා කාණ්ඩයන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1,836/6 දරන සහ 2013 නොවැම්බර් මස 11 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ උපලේඛන I දැක්වෙන පරිදි තීරණය කරනු ලැබේ.

1.3 පත්වීම් ක්‍රියාත්මක වන දිනය සහ පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

2.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1,836/6 දරන හා 2013 නොවැම්බර් මස 11 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් සිදුකර ඇත්තා වූ ද මින් මතු සිදුකරනු ලැබිය හැකි වූ ද සංශෝධනවලට ද, රාජ්‍ය සේවයේ පත්කිරීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

2.3 මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර එකක (01) වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

2.4 එහෙත් වසර තුන (03) ඇතුලත පළමුවැනි කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය සමත්විය යුතුය.

2.5 මෙම පත්වීම භාරගත් දින සිට වර්ෂ පහක් ඉකුත් වීමට පෙර, රජයේ ප්‍රතිපත්තිවලට අනුරූපව රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත් බව ඔබ විසින් සනාථ කළයුතුවේ. ඔබ මෙම පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූයේ සිංහල භාෂාවෙන් නම් ඔබගේ අනෙක් රාජ්‍ය භාෂාව වනුයේ දෙමළ භාෂාව වේ. එසේම ඔබ මෙම පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූයේ දෙමළ භාෂාවෙන් නම් ඔබගේ අනෙක් රාජ්‍ය භාෂාව වනුයේ සිංහල භාෂාව වේ. 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධාන හා ඊට ආනුශංගික වන චක්‍රලේඛවල විධිවිධාන මෙයට අදාළ වේ.

2.6 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත්වේ.

2.7 පත්වීම්ලාභීන්, දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා වාර්තා කළ යුතු ය.

2.8 පත්වීම්ලාභීන් රාජ්‍ය සේවයේ මෙන්ම පළාත් රාජ්‍ය සේවයේ ද සේවය කිරීමට යටත් වේ.

3. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2006, රු. 22,935- 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු. 53,555 ක (මාසික) වැටුප් පරිමාණය හිමි වේ.

4. සුදුසුකම් :

සුදුසුකම් සපුරා තිබිය යුතු බවට *ගැසට් නිවේදනයේ* සඳහන් දිනට පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය.

4.1 *මූලික සුදුසුකම් :*

4.1.1 වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිලධාරියෙකු ලෙස වසර 15 කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ සේවය කර තිබීම සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය සම්පූර්ණයෙන්ම සමත්වීම.

4.1.2. දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්‍ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියෙකු, එම දෙපාර්තමේන්තුවේ වසර 15කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05 ක් එම සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ සේවය කර තිබීම.

4.1.3. ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු ලෙස වසර 15කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ සේවය කර තිබීම සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන රජයේ කාර්මික නිලධාරීන් සඳහා වන තුන්වන විභාගය (1979 ව්‍යවස්ථාව) සම්පූර්ණයෙන් සමත්වීම.

4.1.4 ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු ලෙස වසර 21කට නොඅඩු සේවා කාලයක් සහිතව එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්කර තිබීම සහ එම සේවයේ I ශ්‍රේණියේ වසර 05ක් සේවය කර තිබීම, සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන රජයේ කර්මික නිලධාරීන් සඳහා වන දෙවන විභාගය (1979 ව්‍යවස්ථාව) සම්පූර්ණයෙන් සමත්වී තිබීම.

4.2 *කොන්දේසි සහ නියමයන් :*

4.2.1 තම අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී නිලධාරියා රාජ්‍ය සේවය/පළාත් රාජ්‍ය සේවය තුළ සේවයේ නිරත වී සිටිය යුතුයි.

4.2.2 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පත්වීම ක්‍රියාත්මක කිරීමට නියමිත දිනය වනවිට කිසියම් පත්වීම්ලාභියකු රාජ්‍ය සේවයෙන්/පළාත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වීමට කටයුතු කර නොතිබිය යුතුය.

4.2.3 සුදුසුකම් සපුරා තිබිය යුතු බවට *ගැසට් නිවේදනයේ* සඳහන් දිනට පූර්වාසන්න වසර 05ක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි.

4.2.4 වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුළ පුරප්පාඩු වන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම් කිරීමේදී එම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර නිලධාරියකු ලෙස අඛණ්ඩව සේවයේ යෙදීසිටීම අනිවාර්යය වේ.

4.2.5 දුම්රිය දෙපාර්තමේන්තුව තුළ පුරප්පාඩු වන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ තනතුරු සඳහා අයදුම් කිරීමේදී එම දෙපාර්තමේන්තුවේ අධීක්‍ෂණ කළමනාකරණ තනතුරක් දරන නිලධාරියෙකු ලෙස අඛණ්ඩව සේවයේ යෙදී සිටීම අනිවාර්යය වේ.

5. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

6. *වෙනත් සුදුසුකම් :*

6.1 අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනවන විට එම සේවයේ පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

6.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සහ කොන්දේසි සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. *ලකුණු ලබා දීමේ පටිපාටිය :*

| | |
|---|---|
| සේවා පළපුරුද්ද | - උපරිම ලකුණු 60 |
| කාර්මික දැනුම | - උපරිම ලකුණු 20 |
| අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | - උපරිම ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | - උපරිම ලකුණු 05 |
| මුළු ලකුණු සංඛ්‍යාව | - ලකුණු 100 |

08. *අනන්‍යතාවය :*

පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කල ජාතික හැඳුනුම්පත.
- වලංගු විදේශ ගමන් බලපත්‍රය.

09. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා විධායක සේවා ගණයේ III ශ්‍රේණියට අදාළ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

10. මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

11. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය, කොළඹ 07.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

***ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2014***

1. නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
2. නිලධාරියාගේ නම මුලකුරු සමග :————.
3. දැනට සේවය කරන ස්ථානය (අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව/පළාත් පාලන ආයතනය) :————.
4. ඉංජිනේරු කෙෂ්ත්‍රය (සිවිල්/යාන්ත්‍රික/විදුලි (බැර සහ ලුහු) :————.
5. කාර්යාලයීය ලිපිනය :————.
6. විභාග ප්‍රවේශ පත්‍ර යොමු කළ යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
7. දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.
8. (*a*) උපන් දිනය :————. (*b*) ජාතික හැඳුනුම්පත් අංකය :————.
9. අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට වයස : අවු. :————. මාස :————. දින :————.
10. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරියකු/දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්‍ෂණ කළමනාකරණ සේවයේ නිලධාරියකු/ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ කාර්මික නිලධාරියකු (කලින් ම. ම. කා. සේවය) ලෙස රාජ්‍ය සේවයට බැඳුන දිනය :————.
11. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරියකු/දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්‍ෂණ කළමනාකරණ සේවයේ නිලධාරියකු/ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ කාර්මික නිලධාරියකු (කලින් ම. ම. කා සේවය) ලෙස රාජ්‍ය සේවයේ පත්වීම ස්ථිර කරනු ලැබූ දිනය :————.
12. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරියකු/දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්‍ෂණ කළමනාකරණ සේවයේ නිලධාරියකු/ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ කාර්මික නිලධාරියකු (කලින් ම.ම. කා සේවය) ලෙස රාජ්‍ය සේවයට බැඳුන ස්ථානය (අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත්සභාව/පළාත් පාලන ආයතනය) :————.

13. දැනට සිටින සේවය :—————.

14. දැනට සිටින පංතිය/ශ්‍රේණිය :—————.

15. එක් එක් පංතියට/ශ්‍රේණියට පත්වීම් ලද/උසස්වීම් ලද/අන්තර්ග්‍රහනය කරන ලද දින සහිතව සේවය කරන ලද කාලසීමාවන් අනුපිළිවලින් (වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් එය ද ඇතුළත් කළ යුතු ය) ៖

| *සේවයේ නම* | *පංතිය/ශ්‍රේණිය* | *කාල පරාසය*<br>*දින සිට දින දක්වා* | **සේවා කාලය*<br>*අවු. මාස දින* |
|---|---|---|---|
| | | | |

* අයඳුම්පත් කැඳවනු ලබන අවසාන දිනට

අදාළ ලිපි ලේඛණ සත්‍ය පිටපත් බවට සහතිකකර අමුණා එවිය යුතු ය.

16. අංක 1,836/6 සහ 2013.11.11 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ 7.3.1.2 වගන්තියට අනුව අවම සුදුසුකම් සපුරාලනුයේ (අදාල කොටුවෙහි x සලකුණ යොදන්න. ප්‍රතිඵල ලේඛණ සත්‍ය පිටපත් බවට සහතිකකර අමුණා එවිය යුතු ය.)

(i) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිළධාරියෙකු ලෙස වසර 15කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ සේවය කර තිබීම සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය සම්පූර්ණයෙන්ම සමත්වීම. ☐

ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය සාර්ථකව සම්පූර්ණ කරන ලද දිනය :—————. (ඇමුණුම 01)

(ii) දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියෙකු, එම දෙපාර්තමේන්තුවේ වසර 15කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ සේවය කර තිබීම. ☐

(iii) ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ කාර්මික නිළධාරියෙකු ලෙස වසර 15කට නොඅඩු සේවා කාලයක් සහිතව, ඉන් අවම වශයෙන් වසර 05ක් එම සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ සේවය කර තිබීම සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන රජයේ කාර්මික නිළධාරීන් සඳහා වන තුන්වන විභාගය (1979 ව්‍යවස්ථාව) සම්පූර්ණයෙන් සමත්වීම. ☐

| *විභාගය (1979 ව්‍යවස්ථාව)* | *ක්ෂේත්‍රය (සිවිල්/යාන්ත්‍රික)* | *සුදුසුකම් සාර්ථකව සම්පූර්ණ කරන ලද දිනය*** |
|---|---|---|
| 1 වන විභාගය | | |
| 2 වන විභාගය | | |
| 3 වන විභාගය | | |

** (ඇමුණුම 02 හෝ 03)

(iv) ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ කාර්මික නිළධාරියෙකු ලෙස වසර 21කට නොඅඩු සේවා කාලයක් සහිතව එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්කර තිබීම සහ එම සේවයේ I ශ්‍රේණියේ වසර 05ක් සේවය කර තිබීම සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන රජයේ කාර්මික නිළධාරීන් සඳහා වන දෙවන විභාගය (1979 ව්‍යවස්ථාව) සම්පූර්ණයෙන් සමත්වී තිබීම. ☐

| *විභාගය (1979 ව්‍යවස්ථාව)* | *ක්ෂේත්‍රය (සිවිල්/යාන්ත්‍රික)* | *සුදුසුකම් සාර්ථකව සම්පූර්ණ කරන ලද දිනය*** |
|---|---|---|
| 1 වන විභාගය | | |
| 2 වන විභාගය | | |

** (ඇමුණුම 02 හෝ 03)

17. *අයදුම්කරුගේ සතුටුදායක සේවා කාලය :*

(i) ඔබගේ සේවා කාලය තුළ දී විනයානුකූල දඬුවමකට භාජනය වී ඇත්නම්, වරදේ ස්වභාවය, දී ඇති දඬුවම හා දඬුවම දුන් දිනය සඳහන් කරන්න. :————.

(ii) පසුගිය පස් වසරක වැටුප් වර්ධක ලබා ඇත් ද යන වග :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හා වැරදි සහගත බව පත්වීම ලබා දීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුරට නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දික් නොමැතිව පත් කිරීම අවලංගු කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය*

දැනට මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරී/දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සේවයේ නිලධාරී/ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (කලින් ම. ම. කා. සේවය) ....................... මහතා/මහත්මිය/මෙනවිය ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත්කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති අතර, එම නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද මෙම ඉල්ලුම්පත්‍රය සුදුසු කටයුතු සඳහා ඉදිරිපත් කරමි. තව ද ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූල කටයුත්තක් අරඹා ඇති/නැතිබවත්, ඉදිරියේ දී එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට කරුණු ඉදිරිපත් වී ඇති/නැති බවත් සහතික කරමි. (අනවශ්‍ය වචන කපා හරින්න.)

————,
අත්සන සහ නිලමුද්‍රාව (ලේකම්/ප්‍රධාන ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානී).

දිනය :————.

ඇමුණුම 01

ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

නම :————.

*ප්‍රායෝගික පරීක්ෂණය :*

| *විෂය* | | *ලකුණු* | | | |
|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ............ | *වර්ෂය* ............ | *වර්ෂය* ............ | *වර්ෂය* ............ |
| I වන භාගය | | | | | |
| I වන කාණ්ඩය | මට්ටම් ගැනීම (ප්‍රායෝගික පරීක්ෂණය) (>50%) | | | | |
| II වන කාණ්ඩය | මිණුම් (බිම් මැනුව) ප්‍රායෝගික පරීක්ෂණය (>50%) | | | | |

*ලිඛිත පරීක්ෂණය :*

| *විෂයය* | | *ලකුණු* | | | |
|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ………… | *වර්ෂය* ………… | *වර්ෂය* ………… | *වර්ෂය* ………… |
| I වන භාගය | | | | | |
| III වන කාණ්ඩය | (ආ) ව්‍යුහවාදය (ව්‍යුහ සහ ද්‍රව්‍ය වල ප්‍රභලතාව පිළිබඳ සිද්ධාන්ත) | | | | |
| | (ආ) ද්‍රාව විද්‍යාව | | | | |
| II වන භාගය | | | | | |
| I වන කාණ්ඩය | (අ) සැලසුම්, ඇඳීම හා සම්මත පිරිවිතර | | | | |
| | (ආ) වාරිමාර්ග | | | | |
| II වන කාණ්ඩය | (අ) ප්‍රමාණය (ප්‍රමාණ සමීක්ෂණය) | | | | |
| | (ආ) ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ දෙපාර්තමේන්තු විධිවිධාන | | | | |

ලිඛිත පරීක්ෂණයේ අවම ලකුණු මට්ටම 40%

ලිඛිත පරීක්ෂණවල ලකුණු සාමාන්‍ය (>50%) =………………

***සටහන* :** 1 වන භාගයේ 1 වන කාණ්ඩයෙන් හා II වන කාණ්ඩයෙන් සමත්වීමට අපේක්ෂකයන් එම එක් එක් කාණ්ඩයෙන් 50% අවමයක් ලබා ගත යුතුය. අනෙක් ඕනෑම කාණ්ඩයකින් එක් එක් විෂයයෙන් 40% අවමයක් ලබා ගැනීමෙන් එම විෂයයෙන් සමත් විය හැකි වුව ද විභාගයෙන් සමත්වීම පිණිස සියලුම ලිඛිත පරීක්ෂණ පත්‍ර සඳහා 50%ට නොඅඩු සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

හතරකට නොවැඩි උත්සහ වාර ගණනක දී සියලුම භාණ්ඩ ඉහත සඳහන් පරිදි සමත් වීමෙන් ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය සමත් විය යුතුය.

ඇමුණුම 02

**රාජ්‍ය සේවා කාර්මික නිලධාරීන් සඳහා පවත්වනු ලබන විභාගය (සිවිල්/යාන්ත්‍රික)**
**1979 ව්‍යවස්ථාව - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

නම :——————————.

1 වන පරීක්ෂණය (සිවිල්)

*අනිවාර්ය විෂයයන් :*

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ……… | *වර්ෂය* ……… | *වර්ෂය* ……… | *වර්ෂය* ……… | *වර්ෂය* ……… | *වර්ෂය* ……… |
| • මැනීම හා මට්ටම් ගැනීම ලිඛිත පරීක්ෂණය (>35%) | | | | | | | |
| • මිණුම් ප්‍රායෝගික (>35%) | | | | | | | |
| • මට්ටම් ගැනීම ප්‍රායෝගික (>35%) මැනීම හා මට්ටම් ගැනීම (පහළ පත්‍රය) | 03 | | | | | | |

| *විෂය* | *විෂය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| ගණිතය (පහළ පත්‍රය) | 01 | | | | | | |
| ප්‍රමාණ ගැනීම (පහළ පත්‍රය) | 02 | | | | | | |
| සැලසුම් ඇඳීම හා පිටපත් කිරීම | 04 | | | | | | |

වෛකල්පිත විෂයයන් : පහත දැක්වෙන විෂයයන් ගෙන් දෙකක් (2)

| *විෂය* | *විෂය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| මූලික ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තුව | 05 | | | | | | |
| ජල සම්පාදනය හා ජලාපවහනය | 06 | | | | | | |
| වැඩ බිම පාලනය | 07 | | | | | | |
| පාරවල් තැනීම හා නඩත්තුව | 08 | | | | | | |

සෑම විෂයකටම 40% අවම ලකුණු ප්‍රමාණයක් ගත යුතුය.

විභාගය සමර්ථ වීම සඳහා සාමාන්‍ය (45%) =..................

*2 වන පරීක්ෂණය (සිවිල්)*

අනිවාර්ය විෂයයන්

| *විෂය* | *විෂය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| • මැනීම හා මට්ටම් ගැනීම ලිඛිත පරීක්ෂණය (>35%) | | | | | | | |
| • මිනුම් ප්‍රායෝගික (>35%) | | | | | | | |
| • මට්ටම් ගැනීම ප්‍රායෝගික (>35%) | | | | | | | |
| මැනීම හා මට්ටම් ගැනීම | 23 | | | | | | |

| *විෂය* | *විෂය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| ගණිතය (ඉහළ පත්‍රය) | 21 | | | | | | |
| ප්‍රමාණ ගැනීම (ඉහළ පත්‍රය) | 22 | | | | | | |
| ඇඳීම | 24 | | | | | | |

වෛකල්පිත විෂයයන් : පහත දැක්වෙන විෂයයන්ගෙන් තුනක් (3)

| විෂය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... |
| ගොඩනැගිලි ඉදිකිරීම (ඉහළ පත්‍රය) | 25 | | | | | | |
| ජල සම්පාදනය හා ජලාපවහනය | 26 | | | | | | |
| පාරවල් තැනීම හා නඩත්තුව | 27 | | | | | | |
| පාලම් හා විශාල ආකෘති තැනීම හා නඩත්තුව | 28 | | | | | | |
| වැඩ සංවිධාන | 29 | | | | | | |

සැම විෂයකටම 40% අවම ලකුණු ප්‍රමාණයක් ගත යුතු ය.

සම්පූර්ණ විභාගය සාමාර්ථ වීම සඳහා සාමාන්‍ය (45%)

**3 වන පරීක්ෂණය (සිවිල්)**

අනිවාර්ය විෂයයන්

| විෂය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... |
| • මැනීම හා මට්ටම් ගැනීම ලිඛිත පරීක්ෂණය (>35%) | | | | | | | |
| • මිණුම් ප්‍රායෝගික (>35%) | | | | | | | |
| • මට්ටම් ගැනීම ප්‍රායෝගික (>35%) | | | | | | | |
| මැනීම හා මට්ටම් ගැනීම | 48 | | | | | | |

| විෂය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව I | 41 | | | | | | |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව III | 44 | | | | | | |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව IV | 45 | | | | | | |
| ගොඩනැගිලි ප්‍රමාණ ගැණීම හා ගොඩනැගිලි ඇස්තමේන්තු කිරීම | 46 | | | | | | |
| වාස්තු විද්‍යාත්මක ඇඳීම | 47 | | | | | | |

වෛකල්පිත විෂයයන් : පහත දැක්වෙන විෂයයන් ගෙන් එක් විෂයයක් (1)

| විෂය | විෂය අංකය | ලකුණු | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... | වර්ෂය ......... |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව II | 42 | | | | | | |
| පාරවල් තැනීම හා නඩත්තුව | 43 | | | | | | |

සැම විෂයකටම 40% අවම ලකුණු ප්‍රමාණයක් ගත යුතු ය.

සම්පූර්ණ විභාගය සාමාර්ථ වීම සඳහා සාමාන්‍ය (45%)

**රාජ්‍ය සේවා කාර්මික නිලධාරින් සඳහා පවත්වනු ලබන විභාගය (සිවිල්/යාන්ත්‍රික)**
1979 ව්‍යවස්ථාව - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

නම :——————————.

*1 වන පරීක්ෂණය (යාන්ත්‍රික)*

සියලුම විෂයයන් අනිවාර්ය වේ

| *විෂය* | *විෂය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| ගණිතය (පහළ පත්‍රය) | 01 | | | | | | |
| යාන්ත්‍රික ප්‍රමාණය | 09 | | | | | | |
| යාන්ත්‍රික ඇඳීම හා පිටපත් කිරීම | 10 | | | | | | |
| වැඩපල පුහුණුව | 11 | | | | | | |
| ප්‍රායෝගික වැඩ (වැද්දුම් වඩුකම්හල්) ආදිය | 12 | | | | | | |
| මැණීම හා මට්ටම ගැණීම (ප්‍රායෝගික) | 13 | | | | | | |

සෑම විෂයකටම 40% අවම ලකුණු ප්‍රමාණයක් ගත යුතු ය.
සම්පූර්ණ විභාගය සාමාර්ථ වීම සඳහා සාමාන්‍ය (45%) =..................

*2 වන පරීක්ෂණය (යාන්ත්‍රික)*

සියලුම විෂයයන් අනිවාර්ය වේ.

| *විෂය* | *විෂය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| ගණිතය (ඉහළ පත්‍රය) | 21 | | | | | | |
| යාන්ත්‍රික ප්‍රමාණ ගැණීම (උසස් පත්‍රය) | 30 | | | | | | |
| යාන්ත්‍රික ඇඳීම හා පිටපත් කිරීම (ඉහළ පත්‍රය) | 31 | | | | | | |
| කර්මාන්ත ශාලා පුහුණුව | 32 | | | | | | |

සෑම විෂයකටම 40% අවම ලකුණු ප්‍රමාණයක් ගත යුතුය.
සම්පූර්ණ විභාගය සාමාර්ථ වීම සඳහා සාමාන්‍ය (45%) =..................

*3 වන පරීක්ෂණය (යාන්ත්‍රික)*

සියලුම විෂයයන් අනිවාර්ය වේ.

| *විෂය* | *විෂය අංකය* | *ලකුණු* | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... | *වර්ෂය* ......... |
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව I | 49 | | | | | | |
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව II | 50 | | | | | | |
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව III | 51 | | | | | | |
| ඉංජිනේරු ආර්ථික විද්‍යාව | 52 | | | | | | |
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව - ඇඳීම | 53 | | | | | | |

සෑම විෂයකටම 40% අවම ලකුණු ප්‍රමාණයක් ගත යුතුය.
සම්පූර්ණ විභාගය සාමාර්ථ වීම සඳහා සාමාන්‍ය (45%) =..................

11-331

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.